සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

# 32 - ව්‍යාපාර අධ්‍යයනය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024

## 32 - ව්‍යාපාර අධ්‍යයනය

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

**අභිමතාර්ථ :** ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශයෙන් අපේක්ෂිත අභිමතාර්ථ ඉටු වී ඇති අකාරය තක්සේරු කිරීමට හැකිවන පරිදි මෙන්ම විෂය දැනුම, අවබෝධය, භාවිතය, විශ්ලේෂණය හා සංස්ලේෂණය හැකියාවන් වඩාත් හොඳින් ඇගයීමට ලක් කිරීමට හැකිවන අයුරින් ප්‍රශ්න හා ගැටළු මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු කර ඇත.

**ලකුණු පිරිනමන ආකාරය**

**ව්‍යාපාර අධ්‍යයනය I.**

| | | | |
|---|---|---|---|
| බහුවරණ 30 යි. | ලකුණු 02 බැගින් | - | 60 |
| හිස්තැන් පිරවීම 10 | ලකුණු 02 බැගින් | - | 20 |
| නිශ්චිත කෙටි පිළිතුරු 10 | ලකුණු 02 බැගින් | - | 20 |
| | | | 100 |

**ව්‍යාපාර අධ්‍යයනය II.**

අ. කොටස - ප්‍රශ්න 04 යි

ආ. කොටස - ප්‍රශ්න 04 යි

එක් කොටසකින් ප්‍රශ්න 02 ක් වත් තෝරා ගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතු ය.

1 සිට 8 දක්වා ප්‍රශ්න 08 යි. සෑම ප්‍රශ්නයක්ම කොටස් 05 කින් යුක්තවේ.

කොටසකට ලකුණු 04 බැගින් ප්‍රශ්නයකට ලකුණු 20 යි.

මුළු ලකුණු ප්‍රශ්න 05 ට ලකුණු 20 බැගින් - 100

**I හා II පත්‍රය සඳහා - 200**

**අවසාන ලකුණ - 100**

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

| | | | |
|---|---|---|---|
| (i) | ............................................<br>............................................<br>............................................ | √ | △ $\frac{4}{5}$ |
| (ii) | ............................................<br>............................................<br>............................................ | √ | △ $\frac{3}{5}$ |
| (iii) | ............................................<br>............................................<br>............................................ | √ | △ $\frac{3}{5}$ |

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2023 (2024)

| විෂය අංකය<br>பாட இலக்கம் | 32 | විෂයය<br>பாடம் | ව්‍යාපාර අධ්‍යයනය |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 2 |
| 02. | 2 | 12. | 5 | 22. | 1 |
| 03. | 4 | 13. | 4 | 23. | 4 |
| 04. | 1 | 14. | 4 | 24. | 3 |
| 05. | 3 | 15. | 4 | 25. | 5 |
| 06. | 4 | 16. | 3 | 26. | 3 |
| 07. | 4 | 17. | 2 | 27. | 5 |
| 08. | 2 | 18. | 1 | 28. | 3 |
| 09. | 4 | 19. | 1 | 29. | 3 |
| 10. | 2 | 20. | 3/4 | 30. | 1 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 02 බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 30 = 60

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**31 සිට 50 දක්වා සෑම පිළිතුරකටම ලකුණු 1/2 බැගින් හිමි වේ.**

31. අ) පාරිසරික, සමාජ

ආ) නීතිමය/ නෛතික, ආචාර ධර්ම/ සදාචාරාත්මක

32. අ) පොලී අනුපාතය, බදු හා බදු නොවන/ රාජ්‍යය

ආ) පිරිවැටුම්, රඳවා ගැනීමේ

33. අ) ලිඛිත, සමානව/ සම සමව/ සමසේ

ආ) ඈපයෙන්, ලාභ

34. අ) වෙළෙඳ, මුදල්

ආ) තැරැව්කාර/ කොටස් තැරැව්කාර, විනිමය

35. අ) කාණ්ඩ/ සමූහ, කාර්යය

ආ) සංඛ්‍යානමය, කව

36. අ) නිර්මාණ/ මෝස්තර, නිෂ්පාදන

ආ) නිෂ්පාදිත, ස්ථාවර/ ස්ථානීය

37. අ) පවුල්, භාණ්ඩ

ආ) බණ්ඩනය, කොටස

38. අ) මූල්‍ය, මෙහෙයුම්

ආ) ආවරණ, පිරිවැටුම්

39. අ) පුහුණුව, සංවර්ධනය

ආ) සමිති, කේවල් කිරීම

40. අ) ස්ථාවර, විචල්‍යය

ආ) කාණ්ඩ/ සමූහ, තත්කාලීන

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

41. 1. ආර්ථික වර්ධනයට දායකවීම

2. ප්‍රාදේශීය සම්පත් උපයෝජනයට

3. ජීවන තත්ත්වය උසස් කිරීමට

4. විදේශ විනිමය ඉපයීමට

5. නවෝත්පාදනයට හා තාක්ෂණික දියුණුවට

6. රැකියා ජනිත කිරීමට

7. සමාජීය පද්ධතිය දියුණු කිරීම

42.

A. = විකුණුම් ප්‍රවර්ධනය
B. = පෞද්ගලික අලෙවිය
C. = මහජන සම්බන්ධතා
D. = සෘජු අලෙවිකරණය

43. 1. අරමුණු ඉටු වූවාද නැද්ද යන්න පිළිබඳව අවබෝධය ලබා ගැනීමට

2. ව්‍යාපාරයේ සාර්ථකත්වය මැනීම සඳහා

3. මෙහෙයුම් කාර්යක්ෂමතාව සැසඳීම හා වර්ධනය කර ගැනීම සඳහා

4. අනාගතයේ වර්ධන අවස්ථා හඳුනා ගැනීම සඳහා

5. අවදානම් කළමනාකරණය සඳහා

6. තරගකාරිත්ව වාසි සැසඳීම සඳහා

7. මූල්‍ය කළමනාකරණය සඳහා

8. සම්පත් කළමනාකරණය සඳහා

44.

1. රක්ෂණ සමාගම්
2. සේවක අර්ථසාධක අරමුදල (E.P.F.)
3. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල (E.T.F.)
4. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල්
5. අනුමත විශ්‍රාම හා අර්ථසාධක අරමුදල

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

45.

1. තම හැකියා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම
2. මූල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමට
3. උසස්වීම් සඳහා සුදුසුකමක් වීම
4. පුහුණුව සඳහා අවස්ථාවක් වීම
5. සේවා තෘප්තිය ඇතිවීම

46.

1. දත්ත එක්රැස් කිරීම
2. දත්ත සැකසීම
3. දත්ත ගබඩාකරණය
4. තොරතුරු බෙදා හැරීම
5. දත්ත පදනම් කරගත් තීරණ ගැනීම
6. දත්ත විශ්ලේෂණය
7. පද්ධතියේ කාර්ය සාධනය පාලනය කිරීම

47.

1. රාජ්‍ය ණය කළමනාකරණය
2. විදේශ විනිමය පාලනය
3. කුඩා පරිමාණ මූල්‍යකරණය වැඩසටහන් සඳහා ග්‍රාමීය ණය යෝජනා ක්‍රම පිළිබඳ මූලික ආයතනය ලෙස කටයුතු කිරීම
4. සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය

48.

1. AI - කෘතිම බුද්ධිය (Artficial Intelligence)
2. WWW - ලෝක ව්‍යාප්ත ජාල පහසුකම් (World Wide Web)
3. LAN - ප්‍රාදේශීය ක්ෂේත්‍ර ජාල (Local Area Network)
4. VOIP - කථන පහසුකම් (Voice Over Internet Protocol)

49.

1. ආනයනකරු
2. ආනයනකරුගේ බැංකුව
3. අපනයනකරු
4. අපනයනකරුගේ බැංකුව

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

50.

1. ව්‍යාපාරික ව්‍යාපෘති පිරිවැය
2. අනාගත ලාභදායිත්වය
3. මුදල් ප්‍රවාහය සිදුවන ආකාරය
4. ණය ආපසු ගෙවීමේ හැකියාව
5. ඇප සුරැකුම් අවශ්‍යතාවය
6. ව්‍යාපාර උපාය මාර්ග

Download all Past Papers>> https://bookbeekid.com/resource/past-papers/

## I කොටස

1. අමන්දා ක්ෂණික ආහාර අලෙවිසැලක හිමිකරු මෙන්ම කළමනාකරු ද වේ. ඇය විසින් මාර්ගගත ක්‍රමය මගින් ඇණවුම් භාරගෙන සෞඛ්‍ය සම්පන්න කාබනික ආහාර අලෙවි කරනු ලැබේ. කෙසේ වුවත්, රටෙහි ඇති වූ ආර්ථික අස්ථායීතාවය, විදේශිය වරලත් ආයතනවලින් ඇති වූ තරගය සහ ප්ලාස්ටික් ඇසුරුම් සඳහා වූ නීතිමය සීමා හේතුවෙන් කාබනික ආහාරවල විකුණුම් පරිමාව අඩු විය. එහි ප්‍රතිඵලයක් ලෙස සමහර සේවකයින්ගේ සේවය තාවකාලිකව ඇය තීරණය කළා ය.

(i) (අ) අමන්දාගේ ව්‍යාපාරය අයත් වන්නේ කුමන නිෂ්පාදන අංශයට ද? ඔබේ පිළිතුරට හේතුවක් දක්වන්න. (ලකුණු 02 යි)

සේවා අංශයට **(ලකුණු 01)**

හේතු -

ආහාර ද්‍රව්‍ය වෙළඳාම මගින් ආගන්තුක සත්කාර ඉටු කරන නිසා කරන නිසා

**(ලකුණු 01)**

(ආ) ව්‍යාපාරයේ හිමිකාර-කළමනාකරු ලෙස අමන්දාට ඇති වාසි දෙකක් හා අවාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

වාසි -

1. පහසුවෙන් ආරම්භ කළ හැකිවීම
2. සියළු ලාභ අයිතිකරු සතුවීම
3. ස්වාධීන තීරණ ගත හැකිවීම
4. බලපවත්නා නීතිරීති හා රෙගුලාසි අවමවීම
5. ගනුදෙනුකරුවන් සමග ඍජු සම්බන්ධතා පවත්වාගත හැකිවීම
6. ව්‍යාපාරික තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂාවීම

**(1/2 x 2 = ලකුණු 01)**

අවාසි -

1. ප්‍රාග්ධනය සපයා ගැනීමේ දුෂ්කරතා පැවතීම
2. අයිතිකරු විසින්ම තීරණ ගැනීම නිසා ඒවා අසාර්ථක විය හැකිවීම
3. අලාභ තනිව භුක්ති විඳීමට සිදුවීම
4. ව්‍යාපාරය පුළුල් වන විට කළමනාකරණය අපහසුවීම

**(1/2 x 2 = ලකුණු 01)**

(ii) (අ) අමන්දාගේ ව්‍යාපාරයේ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

1. විද්‍යුත් ක්‍රමයට ව්‍යාපාර පවත්වා ගෙන යාම
2. සෞඛ්‍ය හිතකර ආහාර සැපයීම
3. අයිතිකරුම කළමනාකරු වීම

**(1 x 2 = ලකුණු 02)**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ආ) අමන්දාගේ ව්‍යාපාරය ආර්ථිකයේ වර්ධනයට දායක විය හැකි ආකාර **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

1. ජාතික නිෂ්පාදිතය වර්ධනය කර ගැනීමට දායකත්වය සැපයීම
2. රැකියා අවස්ථා ඇති කිරීම
3. නවෝත්පාදන බිහි කිරීමට දායක වීම
4. රජයට බදු ආදායමක් ලැබීම
5. පරිසර හිතකාමී බව
6. සෞඛ්‍යය සම්පන්න ජනතාවක් බිහි කිරීමට දායකවීම

**(1/2 x 4 = ලකුණු 02)**

(iii) (අ) ඉහත සිද්ධිය ආශ්‍රයෙන් අමන්දාගේ ව්‍යාපාරය කෙරෙහි බලපෑම් ඇති කරනු ලබන ආසන්න පරිසර සාධක **දෙකක්** සහ සාර්ව පරිසර සාධක **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

- ආසන්න පරිසර සාධක
    1. සැපයුම්කරුවන්
    2. ගනුදෙනුකරුවන් (පාරිභෝගිකයින්)
    3. තරගකරුවන්

**(1/2 x 2= ලකුණු 01)**

- සාර්ව පරිසර සාධක
    1. නෛතික පරිසරය
    2. ආර්ථික පරිසරය
    3. තාක්‍ෂණික පරිසරය

**(1/2 x 2= ලකුණු 01)**

(ආ) අමන්දාගේ ව්‍යාපාරය විසින් සමාජය වෙත ඉටුකළ යුතු සමාජීය වගකීම් **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

1. රැකියා අවස්ථා ජනිත කිරීම
2. අපද්‍රව්‍ය කළමනාකරණය
3. හරිත නිෂ්පාදිත බිහි කිරීම
4. ප්‍රජා සත්කාර සේවා ඉටු කිරීම
5. පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම

**(1 x 2= ලකුණු 02)**

(iv) (අ) ශ්‍රී ලංකාවේ ආහාර (ලේබල් කිරීමේ හා ප්‍රචාරණය කිරීමේ) නියෝග 2005 අනුව ආහාර ඇසුරුම්වල අනිවාර්යයෙන් සඳහන් කළ යුතු තොරතුරු **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

1. අඩංගු ද්‍රව්‍ය පිළිබඳ විස්තර
2. නිෂ්පාදන කාණ්ඩ අංකය
3. කල් ඉකුත් වන දිනය
4. නිෂ්පාදිත දිනය
5. බර හෝ පරිමාව ගබඩා කිරීමේ උපදෙස්

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

6. නිෂ්පාදකයාගේ නම හා ලිපිනය
7. නිෂ්පාදිත රට
8. ගබඩා කිරීමේ උපදෙස්

**(1/2 x 4= ලකුණු 02)**

(ආ) ක්ෂණික ආහාර අලෙවි කරනු ලබන විදේශීය වරලත් ආයතන අමන්දාගේ ව්‍යාපාරයේ තරගකරුවන් ලෙස සැලකිය යුත්තේ ඇයි දැයි හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

1. සමාන භාණ්ඩ නිෂ්පාදනය කිරීම
2. සමාන ඉලක්ක වෙළඳපලක් තුළ ක්‍රියාත්මකවීම
3. ඉලක්කගත වෙළඳපොල කොටසට ඇතුල්වීම

**(1 x 2= ලකුණු 02)**

(v) (අ) සේවකයින්ගේ සේවය නතර කිරීම මෙම ව්‍යාපාරයේ සේවයේ නියුතු සේවකයින්ට බලපාන ආකාරය විස්තර කරන්න. (ලකුණු 02 යි)

1. සේවකයින් අභිප්‍රේරණ නොවීම
2. කැපවීම අඩුවීම
3. නිෂ්පාදන අඩුවීම නිසා කාර්යඵල අඩුවීම
4. ඉච්ඡා භංගත්වයට පත්වීම
5. රැකියා අවිනිශ්චිත තත්වයක් ඇතිවීම
6. රැදී සිටින සේවකයිනගේ රැකියා පීඩනය වැඩිවීම

(ආ) අහිමි වූ විකුණුම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා අමන්දාට ක්‍රියාත්මක කළ හැකි උපායමාර්ග **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 02 යි)

1. ගුණත්වයෙන් ඉහළ නිෂ්පාදිත මිළදී ගෙන අලෙවි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම (ගුණාත්මක සේවාවක් සැපයීම)
2. තරගකරුවන්ට වඩා අඩු මිලක් අය කිරීම හා ඉහළ සේවා පහසුකම් සැපයීම
3. පරිසර හිතකාමී ඇසුරුම් සහිත නෂ්පාදිත අලෙවියට යොමු වීම
4. විශේෂඥතාවය ලැබූ සුහද ආචාරශීලී සේවකයින් යොදා ගැනීම
5. ගණුදෙනුකරුට ඉහළ අගයක් ලබා දීම සඳහා සේවා සපයන ස්ථානයේ පරිසරය හා වටපිටාව නිර්මාණය කිරීම
6. සේවා සැපයීමට යෝග්‍ය මෙහෙයුම් පද්ධතියක් හා අලෙවියෙන් පසු සේවා සැපයීමට කටයුතු කිරීම

**(1 x 2= ලකුණු 02)**

**(මුළු ලකුණු 20)**

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

2. කලන හා අක්බාර්ගේ නීති උපදේශක විසින් ඔවුන්ගේ කෘෂි ෆ් පාරය හවුල් ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරීමට ඔවුන්ට උපදෙස් දෙන ලදී. මෑතකදී ඔවුන් හට එකතු කළ අගය සහිත ඉත් සඳහා ඇණවුමක් ලැබිණි. මෙම ඇණවුම සම්පූර්ණ කිරීම සඳහා රුපියල් මිලියන 5ක අතිරේක ආයෝජනයක් අවශ්‍ය වන හෙයින් ඒ සඳහා ඔවුන් විසින් පහත විකල්ප සලකා බලමින් සිටී:

- නව හවුල්කරුවකු බඳවා ගැනීම
- පෞද්ගලික සීමිත සමාගමක් පිහිටුවීම
- බැංකු ණය මුදලක් ලබා ගැනීම

(i) (අ) කලන සහ අක්බාර් තම ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් ලෙස පිහිටුවීමෙන් ලබාගත හැකි වාසි හතරක් ලියන්න. (ලකුණු 02 යි)

1. පහසුවෙන් ආරම්භ කළ හැකිවීම
2. ස්වෙච්ඡාවෙන් විසුරුවා හැරිය හැකිවීම
3. වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකිවීම
4. කීපදෙනෙකුගේ හැකියා හා දක්ෂතා ඒකරාශී කර ගත හැකිවීම
5. වගකීම කීප දෙනෙකු අතර බෙදී යාම
6. සාමුහික වගකීම නිසා උනන්දුව හා කාර්යක්ෂමතාවය වැඩිවීම

**(1/2 x 4 = ලකුණු 02)**

(ආ) තම ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් ලෙස ශ්‍රී ලංකාවේ 1918 අංක 06 දරන ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි කිරීමෙන් කලන සහ අක්බාර්ට ලබාගත හැකි වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

1. ව්‍යාපාරයේ නීතිමයභාවය තහවුරුවීම (නීතිමය භාවිතය ලැබීම)
2. ව්‍යාපාරයට පිළිගැනීමක් ලැබීම
3. ණය ලබා ගැනීමේදී පහසුවක් වීම
4. ගණුදෙනුකරුවන්ගේ විශ්වාසය දිනා ගත හැකිවීම
5. ආරවුල් නිරාකාරණය කර ගැනීමේ හැකියාව
6. සමාගමක් බවට පරිවර්තනය කිරීමට පහසුවීම

**(1 x 02 = ලකුණු 02)**

(ii) (අ) කෘෂි නිෂ්පාදිත සඳහා නිෂ්පාදන පිරිවැය ඉහළ යන්නේ නම්, එය ව්‍යාපාරිකයින් සහ පාරිභෝගිකයින් හට බලපාන්නේ කෙසේ ද? (ලකුණු 02 යි)

<u>ව්‍යාපාරිකයාට</u>

1. යෙදවුම් පිරිවැය වැඩි වේ. **(1/2 x 2 = ලකුණු 01)**
2. විකුණුම් අඩු වේ.
3. ලාභය අඩුවේ.

<u>පාරිභෝගිකයාට</u>

1. මිළ වැඩි වේ
2. ජීවන තත්වය අඩු වේ
3. විකල්ප භාණ්ඩ සෙවීමට යොමු වේ **(1/2 x 2 = ලකුණු 01)**

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ආ) හවුල් ව්‍යාපාරයකට හවුල් ඔප්පුවක් නොමැති විටක නව හවුල්කරුවකු බඳවා ගැනීමේදී අනුගමනය කළ යුතු ප්‍රධාන පිළිවෙත දක්වන්න. (ලකුණු 02 යි)

- දැනට සිටින සියළුම හවුල්කරුන්ගේ කැමැත්ත ලබා ගත යුතුය. (සාමූහික එකගත්වය/ ඒකමතික තීරණයක් ගත යුතුය)
- ලාභ බෙදා ගැනීම, ප්‍රාග්ධනය යෙදවීම, වගකීම යනාදිය පිළිබඳ තොරතුරු තීරණය කිරීම

**(1 x 2 = ලකුණු 02)**

(iii) (අ) කලන හා අක්බාර්ට තේ සඳහා අගය එකතු කළ හැකි ආකාර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

1. පැකට් කළ තේ අලෙවි කිරීමේ කටයුතු වල නියැලීම
2. නිෂ්පාදන ගුණත්වය වර්ධනය කිරීම
   උදා: කාබනික තේ සහතික
3. හරිත තේ නිෂ්පාදනයට යොමුවීම
4. පල නවෝත්පාදන ඇති කිරීම
   උදා: තේ ටොෆි
5. විශේෂ තේ නිෂ්පාදන වර්ග නිපදවීම
   උදා: විවිධ රස තේ

**(1 x 2 = ලකුණු 02)**

(ආ) තම කෘෂි නිෂ්පාදන ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ප්‍රවර්ධනය කිරීමට කලන හා අක්බාර් හට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙන් (EDB) ලබාගත හැකි සේවා දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

1. වෙළඳ ප්‍රදර්ශන සඳහා අනුග්‍රහය දැක්වීම
2. අපනයන අලෙවි පහසුකම් සැපයීම
3. උපදේශන සේවා
4. නව වෙළඳ පොල සොයා ගැනීම
5. තාක්ෂණ සේවා සැපයීම

**(1 x 2 = ලකුණු 02)**

(iv) (අ) හවුල් ව්‍යාපාරයක් සීමිත පෞද්ගලික සමාගමකින් වෙනස් වන ප්‍රධාන ආකාර හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

1. පිහිටුවීම
2. නෛතිකභාවය
3. අරමුදල් සම්පාදනය
4. හිමිකාරිත්වය
5. කළමනාකරණය
6. නීතිමය අවශ්‍යතා

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

7. බදු ගෙවීම
8. තීරණ ගැනීම
9. අඛණ්ඩ බව
10. වගකීම

**(ඉහත කරුණු දක්වා එම කරුණු පැහැදිලි කර ඇත්නම් 1/2 x 4 = ලකුණු 02)**

**(කරුණු පමණක් දක්වා ඇත්නම් 1/2 x 2 = ලකුණු 01)**

(ආ) සීමිත පෞද්ගලික සමාගමක සීමා **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

1.කොටස්කරුවන් සීමාවීම නිසා වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගත නොහැකිවීම

2.කොටස් ප්‍රසිද්ධියේ අලෙවි කළ නොහැකිවීම

3.ණය ප්‍රාග්ධන සම්පාදන මාර්ග සීමාවීම

4. ආරම්භ කිරීමේදී ක්‍රියායාදාමය සංකීර්ණ වීම

5.කොටස් අයිතිය නිදහසේ පැවරිය නොහැකිවීම

6.කොටස් වෙළඳපලේ ලැයිස්තු ගත සමාගමක් නොවිය හැකි වීම

7.ද්විත්ව බදුකරණය

8.විසුරුවා හැරීමේදී ක්‍රියාදාමය සංකීර්ණ වීම

**(1/2 x 4 = ලකුණු 02)**

(v) දිගුකාලීන බැංකු ණයක් ලබා ගැනීමෙන් මෙම ව්‍යාපාරයට ලබාගත හැකි වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

**වාසි -**

1. නිශ්චිත පොළියක් පමණක් ගෙවිය යුතුවීම
2. ආදායම් උපයමින් ණය වාරික ගෙවීමට හැකිවීම
3. පොළිය සාපේක්ෂව අඩුවීම
4. ආපසු ගෙවන කාලය පිළිබඳව එකඟතාවයකට පැමිණිය හැකිවීම
5. මූල්‍ය අවදානම අඩුවීම
6. මුදලේ මූර්ත අගය වැඩිවීම
7. විශාල අරමුදලක් ලබා ගත හැකිවීම

**(1 x 2 = ලකුණු 02)**

**අවාසි -**

1. ඇප සුරකුම් තැබීම අනිවාර්යවීම
2. ණය ලබා ගැනීමේ පිරිවැය ඉහළ වීම
3. දිගු කාලීන බැඳීමකට යටත්වීම
4. හිමිකම අවදානමට ලක්වීම
5. නිශ්චිත කාර්යයක් සඳහා පමණක් ණය සැපයීම

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

6. පොළී පිරිවැය වැඩිවීම (1 x 2 = ලකුණු 02)

3. (i) (අ) 'සමාජීය ව්‍යවසායකත්වය' යනු කුමක් ද? (ලකුණු 02 යි)

සාමාජීය මෙහෙවරක් කිරීමේ චේතනාවෙන් සාමාජීය, පාරිසරික, සංස්කෘතික ගැටළුවලට පිළියම් යෙදීමට නව්‍යතා සම්පාදනය කිරීමයි.

(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)

(ආ) සමාජීය ව්‍යවසායකත්වයේ අභියෝග හතරක් ලියන්න. (ලකුණු 02 යි)

1. කුසලතා සහිත සේවකයින් ලබාගැනීමේ හා බඳවා ගැනීමේ අපහසුතා
2. සාමාජීය හා මූල්‍ය අරමුදල් අතර සමබරතාවයක් පවත්වා ගෙන යාම
3. ආයෝජනය සඳහා අරමුදල් ලබා ගැනීමේ ගැටළු
4. ව්‍යාපාරය පුළුල් කිරීමේ අවදානම
5. සාම්ප්‍රදායික ව්‍යාපාර හා තරග කිරීමට සිදුවීම

(1/2 x 4 = ලකුණු 02)

(ii) (අ) ව්‍යවසායකයා සහ ව්‍යාපාරිකයා අතර ඇති වෙනස්කම් දෙකක් විස්තර කරන්න. (ලකුණු 02 යි)

| ව්‍යවසායකයා | ව්‍යාපාරිකයා |
|---|---|
| 1. තමාගේම අදහසක් හෝ නව සංකල්පයක් අනුව ව්‍යාපාරයක් අරඹයි | 1.පවතින අදහසක් හෝ සංකල්පයක් අනුව ව්‍යාපාර අරඹයි |
| 2. ව්‍යාපාරික ප්‍රතිවාදියා වන්නේ තමාමය | 2. තවත් ව්‍යාපාරික ප්‍රතිවාදීන් ඇත |
| 3. නව ව්‍යාපාර අවස්ථා සඳහා සූදානම් වෙයි | 3. නිතරම තමාගේ ව්‍යාපාර කටයුතුවල නිරතවෙයි |
| 4. නවෝත්පාදකයෙකි | 4. සම්ප්‍රදායිකයෙකි |
| 5. අවදානමට මුහුණ දේ | 5. ආරක්ෂාකාරීව කටයුතු කරයි |
| 6. ගැටළු ඇති වූ විට ඒවා පිටු දැකීමට ආරක්ෂාකාරීව කටයුතු කරයි | 6. ගැටළු ඇති වූ විට අධෛර්යමත් වේ |

(1 x 2 = ලකුණු 02)

(ආ) ගනුදෙනුකරුවකු හට විද්‍යුත් ගෙවීම් ක්‍රම මඟින් ලබාගත හැකි වාසි හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

1. ගෙවීම් කටයුතු වේගවත්වීම
2. ගනුදෙනු කිරීමේ පිරිවැය අවමවීම
3. විදේශ ගනුදෙනු සඳහා යොදා ගත හැකිවීම
4. විවිධ ප්‍රතිලාභ ලබාගත හැකිවීම
5. 7 x 24 පුරා ගෙවීම් කටයුතු සිදු කළ හැකිවීම
6. වාර්තා ලබා ගත හැකිවීම

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

7. නම්‍යශීලී භාවය
8. භෞතික සම්බන්ධතා වලින් තොරවීම නිසා මුදලේ ආරක්ෂාව තහවුරු වීම

**(1/2 x 4 = ලකුණු 02)**

(iii) (අ) ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ (MSM) ව්‍යාපාර විශාල පරිමාණයේ ව්‍යාපාරවලින් වෙනස් වන ආකාර හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

1. ප්‍රාග්ධන මාර්ග සීමිතවීම
2. තාක්ෂණික හා යටිතල පහසුකම් අවම වීම
3. නීතිමය සීමා අවම වීම
4. තීරණ ගැනීමේ ආකාරය වෙනස්වීම
5. සේවක සම්බන්ධතාවය වැඩිවීම
6. වෙළඳපොල ප්‍රමාණය කුඩාවීම
7. සාපේක්ෂව සේවක සංඛ්‍යාව අඩුවීම
8. මූල්‍ය බැඳීම් අඩුවීම

**(1/2 x 4 = ලකුණු 02)**

(ආ) ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

1. වෙළඳපොල ගැටළු
2. තාක්ෂණික ගැටළු
3. මූල්‍යමය ගැටළු
4. සේවක ගැටළු
5. යටිතල පහසුකම් ගැටළු
6. ව්‍යාපාර කටයුතු සම්බන්ධ පවුල් ආරවුල් ඇතිවීම
7. කළමනාකරණ ගැටළු

**(1/2 x 4 = ලකුණු 02)**

(iv) (අ) 'උකස් ණය' සහ 'බැංකු අයිරාව' අතර ඇති වෙනස විස්තර කරන්න. (ලකුණු 02 යි)

| උකස් ණය | බැංකු අයිරාව |
|---|---|
| 1. ජංගම ගිණුම අදාළ නොවේ. | ජංගම ගිණුම අදාළ වේ. |
| 2. දිගු කාලීනයි | කෙටි කාලීනයි |
| 3. ඕනෑම මූල්‍ය ආයතනයකින් ලබා ගත හැකිය. | වාණිජ බැංකු වලින් පමණක් ලබා ගත හැකිය. |
| 4. පොළිය සාපේක්ෂව අඩුය. | පොළිය සාපේක්ෂව වැඩිය. |
| 5. මුළු මුදලටම පොළිය ගණනය කරයි. | භාවිත කළ මුදලට හා කාලයට පමණක් පොළිය ගණනය කරයි. |
| 6. මිළට ගන්නා දේපල හා වත්කම් ඇපයට තබයි. | සමහර විට ඇප අවශ්‍ය නොවේ. |

**(සංසන්දනාත්මක පිළිතුරු දෙකක් සඳහා ලකුණු 02)**

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ආ) භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමෙන් ව්‍යාපාරිකයකුට ලබාගත හැකි ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

1. රජය විසින් පොළිය හා පරිණත මුදල ගෙවීම සහතික වීම
2. සුරක්ෂිත ආයෝජනයක්වීම
3. ද්විතීයික වෙළඳපොලේ අලෙවි කළ හැකිවීම
4. ඉහළ ද්‍රවශීලතාවයක් පැවතීම
5. පොළිය මිලදී ගත් අවස්ථාවේම ලැබීම

**(1 x 2 = ලකුණු 02)**

(v) (අ) චෙක්පත්වල පිළිපතෙහි සටහන් පවත්වාගෙන යාමේ පරමාර්ථ දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

1. චෙක්පත පිළිබඳ තොරතුරු දැනගත හැකිවීම (නිකුත් කළ දිනය, ආදායකය ආදිය දැනගත හැකිය)
2. ගෙවීම් සහතිකයක් වීම
3. බැංකු සැසඳීම් පිළියෙල කිරීමේදී තොරතුරු ලබා ගත හැකිවීම
4. බදු හා නීතිමය අවශ්‍යතාවයන් සඳහා යොදා ගත හැකිවීම
5. වංචා වැළැක්වීම සඳහා තොරතුරු ලබා ගත හැකිවීම **(1 x 2 = ලකුණු 02)**

(ආ) 'ක්ෂුද්‍ර මූල්‍යකරණය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

පාරම්පරික බැංකු සේවාවට ප්‍රවේශවීමට නොහැකිවීම නිසා සුළු පරිමාණ ව්‍යාපාරිකයින්ට හා පුද්ගලයින්ට ලබා ගත හැකි මූල්‍ය සේවාව මේ නමින් හැඳින්වේ.

**(ලකුණු 02)**

4. (i) (අ) ජීවිත රක්ෂණයේ ප්‍රතිලාභ හිමිවන පාර්ශ්ව දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

1. රක්ෂිතයා
2. නම් කළ ප්‍රතිලාභීන්

**(1 x 2 = ලකුණු 02)**

(ආ) අපනයන ණය රක්ෂණය මගින් අපනයනකරුට අත්වන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

1. වාණිජ හා වාණිජ නොවන අවදානම් හේතුවෙන් භාණ්ඩ හා සේවා අපනයනකරුවන් මුහුණ දෙන මුදල් නොලැබීම හා ප්‍රමාදවීම්වලට අදාළ වන රක්ෂණ ඔප්පු හඳුන්වා දීම
2. භාණ්ඩ නැව්ගත කිරීමට පෙර හෝ පසු අපනයනකරුවන්ට මූල්‍ය පහසුකම් ලැබෙන පරිදි බැංකු හා වෙනත් මූල්‍ය ආයතනවලට ඇපකර ලබාදීම
3. විදේශීය ගණුදෙනුකරුවන්ගේ තොරතුරු ලබා ගත හැකිවීම

**(1 x 2 = ලකුණු 02)**

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ii) (අ) ව්‍යාපාර සංවිධානයකට සමාජ මාධ්‍යයේ ඇති වාසි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

1. සන්නාම ප්‍රවර්ධනය
2. පුළුල් පාරිභෝගිකයන් පිරිසකට ළඟාවීමට පහසුවීම
3. පිරිවැය අඩුවීම
4. වෙළඳපොල පුළුල්වීම
5. වෙළඳපොල පර්යේෂණය පහසුවීම
6. සේවකයින් ආකර්ශණය පහසුවීම
7. නව භාණ්ඩ හඳුන්වාදීම
8. ඉලක්ක ගත ප්‍රචාරණය පහසුවීම **(1/2 x 4 = ලකුණු 02)**

(ආ) සන්නිවේදනයේදී භාවිත කරනු ලබන සංඥා සහ සංකේතවල ඇති අවාසි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

1. දක්ෂී ගැටළු හා ඌනතා ඇති පාර්ශ්ව සමග තොරතුරු හුවමාරු කර ගැනීමේදී ගැටළු ඇතිවීම
2. සංඥා හා සංකේත විකෘති වී යාමෙන් තොරතුරු සන්නිවේදනයට බාධා ඇතිවීම
3. සමහර සංඥා හා සංකේත අවබෝධ කර ගැනීමට අපහසුවීම
4. සංඥා හා සංකේත අවබෝධ කර ගැනීමට ඒවා පිළිබඳව පෙර දැනුමක් අවශ්‍ය වීම

**(1/2 x 4 = ලකුණු 02)**

(iii) (අ) 'නිර්බාධ වෙළෙඳාම' යන්නෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 02 යි)

තීරු බදු හා තීරු බදු බාධාවලින් තොරව සිදු වන වෙළඳාමයි **(ලකුණු 02)**

(ආ) උදාහරණයක් සහිතව 'බහුවිධ (Multi-modal) ප්‍රවාහනය' යන්න පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

ප්‍රවාහන ක්‍රම එකකට වඩා යොදා ගනිමින් **එක් ප්‍රවාහකයෙකු** භාණ්ඩ එහා මෙහා ගෙන යාම බහුවිධ ප්‍රවාහනය වේ. **(ලකුණු 02)**

(iv) (අ) නියෝජිතයා සහ බෙදාහරින්නා අතර වෙනස්කම් **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

| නියෝජිතයා | බෙදාහරින්නා |
|---|---|
| 1. ප්‍රධානියා වෙනුවෙන් ඔහුගේ බලය මත පාරිභෝගිකයාට භාණ්ඩ අලෙවි කරනු ලබයි. | 1. භාණ්ඩ මිලට ගෙන ගබඩා කර තොග හා සිල්ලර වෙළඳුන්ට හෝ පාරිභෝගිකයින්ට අලෙවි කරනු ලබයි. |
| 2. කොමිස් ලබයි. | 2. ලාභ ලබයි. |
| 3. වෙළඳාමේ අවදානම නොදරයි. | 3. වෙළඳාමේ අවදානම දරයි. |

**(1 x 2 = ලකුණු 02)**

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ආ) තීරුබදු නොවන බාධකවලින් (NTB) තීරුබදු බාධක (TB) වෙනස් වන්නේ කෙසේ දැයි උදාහරණයක් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

ආනයන හා අපනයන මත පනවන බදු තීරු බදු වේ. ජාත්‍යන්තර වෙළඳාමේදී සීමා කිරීම හා අනෙකුත් මූල්‍ය නොවන සීමා තීරු බදු නොවන බාධක වේ.

උදා -

වාහන ආනයනය කිරීමේදී අය කරනු ලබන්නේ තීරු බදු වේ. ඒ සඳහා අදාළ සහතික ලබා ගැනීම තීරු බදු නොවන බාධකයන් වේ.

**(පැහැදිලි කිරීමට ලකුණු 01**
**උදාහරණයට ලකුණු 01)**

(v) (අ) නිෂ්පාදකයාට තොග වෙළෙඳාම වැදගත් වන්නේ ඇයි දැයි හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

1. නිෂ්පාදකයාගේ නිෂ්පාදිත තොග වශයෙන් ලබා ගැනීම
2. වෙළඳපල පිළිබඳ තොරතුරු ලබාදීම
3. මූල්‍ය පහසුකම්, අමුද්‍රව්‍ය ලබාදීම ආදී විවිධ සේවාවන් නිෂ්පාදකයාට ලබාදීම
4. නිෂ්පාදකයාගේ කාර්ය පහසු කිරීම
5. බෙදා හැරීමේ හා විකිණුම් ප්‍රයත්නයන් අවම වීම
6. නිෂ්පාදකයාගේ අවදානම අඩුවීම
7. එක් එක් ස්ථානවල ගබඩා පවත්වාගෙන යාමෙන් නිෂ්පාදනය ප්‍රදර්ශනය වීම

**(1/2 x 4 = ලකුණු 02)**

(ආ) ව්‍යාපාරිකයකු හට විද්‍යුත් වෙළෙඳාමෙන් අත්වන වාසි හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

1. මිලදී ගැනීම් හා විකිණීම් පහසුකම්
2. තොග පවත්වා ගෙන යාමේ පිරිවැය අඩුවීම
3. වැඩි පාරිභෝගික සංඛ්‍යාවකට සේවා පහසුකම් ලබාදිය හැකිවීම
4. 7 x 24 ගෝලීය වශයෙන් සේවා සැපයීමට හැකිවීම
5. සේවක පිරිවැය අඩුවීම
6. මූල්‍ය අවදානම් අඩුවීම
7. ගණුදෙනුකරුවන්ට ක්ෂණික ප්‍රතිචාර දැක්විය හැකිවීම

**(1/2 x 4 = ලකුණු 02)**

Download all Past Papers >> https://bookbeekid.com/resource/past-papers/

## II කොටස

5. කුඩා නිෂ්පාදන පිරියත ක්‍රමය සහ ප්‍රතිචක්‍රීකරණය කරන ලද අමුද්‍රව්‍ය භාවිත කරමින් සෙල්ලම් භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්තශාලාවක් රිද්මා විසින් ආරම්භ කර ඇත. ඇය විසින් විවිධ සේවක පෙළඹවීම් ක්‍රම භාවිත කරනු ලබන අතර තීරණ ගැනීමේදී සේවක සහභාගීත්වය ලබා ගනියි. එසේම, නිෂ්පාදන ක්‍රියාවලියේ ගැටලු ඇතිවීමට පෙර නිවැරදි කිරීමේ ක්‍රමවේදය ඇය විසින් අනුගමනය කරනු ලැබේ. ස්වයං විශ්වාසය, කර්මාන්තයේ විශේෂඥ දැනුම සහ සේවක සහයෝගීතාවය ඇයගේ කළමනාකරණයේ ලක්ෂණ වේ.

(i) (අ) රිද්මා සතු කළමනාකරණ කුසලතා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

1. සංකල්පනාත්මක/ මනෝභාවාත්මක
2. මානව/ අන්තර් පුද්ගල
3. තාක්ෂණික

**(1 x 2 = ලකුණු 02)**

(ආ) චර්යාත්මක පදනම අනුව, ඉහත සිද්ධිය ආශ්‍රයෙන් රිද්මාගේ නායකත්ව ශෛලිය කුමක් දැයි නම් කරන්න. ඔබේ පිළිතුරට හේතුවක් දක්වන්න. (ලකුණු 02 යි)

සේවක අභිමුඛ නායකත්වය **(ලකුණු 01)**

**හේතු-**

**1. තීරණ ගැනීම සඳහා සේවක සහභාගිත්වය යොදා ගැනීම**

**2. විවිධ පෙළඹවීම් ක්‍රම යොදා ගැනීම**

**(ඉහත එක් හේතුවකට ලකුණු 01 යි)**

(ii) (අ) නිෂ්පාදන ක්‍රියාවලිය තුළ රිද්මා භාවිත කරන පාලන ශිල්පීය ක්‍රමය සඳහන් කරන්න. (ලකුණු 02 යි)

ඉදිරි පෝෂණ පාලනය/ වැළැක්වීමේ පාලනය

**(ලකුණු 02)**

(ආ) ළමයින් සඳහා නිෂ්පාදනය කරන සෙල්ලම් භාණ්ඩවල ගුණත්වය සහතික කිරීමට පැවතිය යුතු මූලිකාංග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

1. අහිතකර රසායන ද්‍රව්‍ය අඩංගු නොවීම
2. ප්‍රමිතයට අනුකූලවීම (ආරක්ෂිත බව,කල් පැවැත්ම)
3. ළමා සංවර්ධනයට ඉවහල් වීම
4. ළමයින්ගේ වයසට අනුකූලව භාණ්ඩ නිෂ්පාදනය
5. මනා ක්‍රියාකාරිත්වය

**(මූලිකාංග 2ක් නම් කිරීමට ලකුණු 1/2 x 2 = 01)**
**(ඒවා විස්තර කිරීමට 1/2 x 2 = 01)**

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(iii) රිද්මාට යොදාගත හැකි මූල්‍යමය අභිප්‍රේරණ ක්‍රම **දෙකක්** සහ මූල්‍යමය නොවන අභිප්‍රේරණ ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

**මූල්‍ය අභිප්‍රේරණ ක්‍රම**

1. වැටුප් හා වේතන
2. ප්‍රසාද දීමනා
3. වෙනත් දීමනා
4. ආයතනයේ නිෂ්පාදිත සහන මිළට ලබා දීම
5. ණය පහසුකම් සැපයීම

**(1 x 2 = ලකුණු 02)**

**මූල්‍ය නොවන අභිප්‍රේරණ ක්‍රම**

1. සේවකයින් පුහුණු කිරීම
2.උසස් වීම් ලබාදීම
3.රැකියා සුරක්ෂිත බව ඇති කිරීම
4.යෝග්‍ය වැඩ පරිසරයක් ඇති කිරීම හා නවීන උපකරණ සැපයීම
5.විනෝද චාරිකා, නිවාස, ආහාර පාන, නිල ඇඳුම් ආදිය ලබා දීම
6.සේවකයින් ඇගයීම
7.සම්මාන පිරිනැමීම
8.සේවක බලගැන්වීම

**(1 x 2 = ලකුණු 02)**

(iv) (අ) යන්ත්‍ර ඵලදායිතාවය වැඩිදියුණු කිරීමට කර්මාන්තශාලාවක යොදාගත හැකි ක්‍රම **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

1. දියුණු තාක්ෂණික උපකරණ සහිත යන්ත්‍ර භාවිතයට ගැනීම
2. අබලන් නොවූ යන්ත්‍ර භාවිතයට ගැනීම
3. යන්ත්‍ර සූත්‍ර නිසි පරිදි නඩත්තු කිරීම

**(1 x 2 = ලකුණු 02)**

(ආ) සෙල්ලම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී ප්‍රතිචක්‍රීකරණය කරන ලද අමුද්‍රව්‍ය භාවිත කිරීම මගින් රිද්මාට ලබාගත හැකි වාසි **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

1. පිරිවැය අවම කරගත හැකිවීම
2. ලාභය වැඩිවීම
3. කාබන් ප්‍රමාණය අඩුවීම
4. සමාජ පිළිගැනීමක් ඇතිවීම (සමාජ පාරිසරික වගකීම)
5. නව නිෂ්පාදිත බිහි කළ හැකිවීම
6. රාජ්‍යය අනුග්‍රහය ලැබීම
7. නාස්තිය අපතය අඩුවීම **(කරුණු දෙකක් පැහැදිලි කිරීමට ලකුණු 02)**

**(කරුණු පමණක් ඇත්නම් 1/2 X 2 = ලකුණු 01)**

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(v) (අ) 'කුටි පිරියත' යනු කුමක් ද? (ලකුණු 02 යි)

නිෂ්පාදන ක්‍රියාවලියේ දී එක සමාන යන්ත්‍ර හා විෂම යන්ත්‍ර වෙන වෙනම කුටිවලට සවිකර නිෂ්පාදන කටයුතු ගලා යන ආකාරයට සිදු කිරීම සඳහා පිරියත සැළසුම් කිරීමයි.

**(පැහැදිලි පිළිතුරට ලකුණු 2)**

(ආ) කුටි පිරියතෙහි ඇති වාසියක් හා අවාසියක් ලියන්න. (ලකුණු 02 යි)

වාසි -

1. අමුද්‍රව්‍ය එහා මෙහා ගෙන යාමේ පිරිවැය අඩුවීම
2. පමා කාලය අඩුවීම
3. සන්නිවේදනය පහසුවීම
4. අඩක් නිම කළ වැඩ අඩුවීම
5. ගුණත්වය වැඩිවීම
6. නිෂ්පාදිත ඵලදායීතාවය වර්ධනය
7. නිෂ්පාදන කාල සටහනට අනුකූලව සිදුවීම
8. යන්ත්‍ර අක්‍රිය කාලය සහ සේවකයින්ගේ නිෂ්ක්‍රීය කාලය අඩුවීම

**(1 x 1 = ලකුණු 01)**

අවාසි -

1. ආරම්භක වියදම් ඉහළ යාම
2. විවිධ කුසලතා සහිත පුද්ගලයින් අවශ්‍යවීම
3. සේවක පීඩනය වැඩිවීම
4. නිෂ්පාදන අවහිරතා

**(1 x 1 = ලකුණු 01)**

6. ABC ඔටෝ මොබයිල් (පෞද්ගලික) සමාගම ඉහළ සමාජ තත්ත්වයක් ඇති ධනවත් පුද්ගලයින් ඉලක්ක කරගෙන සුඛෝපභෝගී මෝටර් රථ නිෂ්පාදනය සහ අලෙවිය සිදු කරයි. මෙම සමාගම JIT තොග පාලන ක්‍රමය භාවිත කරන අතර නිෂ්පාදන ජීවන චක්‍රයේ වර්ධන අදියරේ ඇති නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පර්යේෂණ පවත්වනු ලැබේ. සමාගම ප්‍රධාන වශයෙන් මුහුණුපොත, යූ-ටියුබ්, ඉන්ස්ටග්‍රෑම් සහ ටික්ටොක් ප්‍රවර්ධන මාධ්‍ය ලෙස භාවිත කරනු ලබයි. සමාගම මෝටර් රථයක් රු. 10 000 000 කට අලෙවි කරන අතර විචල්‍ය පිරිවැය රු. 3 500 000 කි. ස්ථාවර පිරිවැය රු. 65 000 000 කි.

(i) (අ) 'JIT ක්‍රමය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය අවශ්‍ය වෙලාවට නිවැරදි ප්‍රමාණයෙන් නිෂ්පාදන ක්‍රියාවලියට එකතු කිරීමේ හා නිමැවුම් එසැනින්ම වෙළඳපොලට ඉදිරිපත් කිරීමේ ක්‍රමයයි.

**(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය අවශ්‍ය වෙලාවට නිවැරදි ප්‍රමාණයෙන් නිෂ්පාදන ක්‍රියාවලියට එකතු කිරීමේ හා නිමැවුම් එසැනින්ම වෙළඳපලට ඉදිරිපත්කිරීමේ ක්‍රමයයි

**(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)**

(ආ) තොග පාලනය සඳහා JIT ක්‍රමය යොදා ගැනීමෙන් ඇතිවන වාසි දෙකක් විස්තර කරන්න. (ලකුණු 02 යි)

1. පිරිවැය අඩුවීම තුළින් සමස්ථ ලාභදායිත්වය වැඩිවීම
2. සැපයුම්දාමයේ කළමනාකාරිත්වය කාර්යක්ෂම වීම
3. ගබඩා පිරිවැය අඩු වීම
4. අඩු තොග මට්ටම් නිසා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා අඩුවීම
5. නිමැවුම වර්ධනය වීම
6. ඉල්ලුම අනුව නිෂ්පාදනය සිදු වීම
7. මුදල් ප්‍රවාහය වර්ධනය වීම

**(1 x 2 = ලකුණු 02)**

(ii) (අ) "ඉලක්කගත වෙළෙඳපොළ" යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

කිසියම් නිෂ්පාදකයෙකු තම නිෂ්පාදිත අලෙවි කිරීම සඳහා සමස්ත වෙළඳපොලෙන් නිශ්චිත පාරිභෝගික පිරිසක් කෙරෙහි අවධානය යොමු කිරීම හෙවත් තම නිෂ්පාදිතය පාරිභෝගික කණ්ඩායමක් තෝරා ගෙන ඒ අය වෙනුවෙන්ම හඳුන්වා දීම සඳහා වන වෙළඳපොලයි.

**(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)**

(ආ) ඉහත සමාගමට වෙළෙඳපොළ පර්යේෂණ සිදු කිරීම වැදගත් වන්නේ කෙසේ දැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

පවත්නා වෙළඳපොල තුළ තම භාණ්ඩය තරගකරුවන් හා සාපේක්ෂව වෙළඳපල කොටස, නිෂ්පාදන වර්ධනය සඳහා කොතෙක් දුරට සාර්ථක වී ඇත්ද නැත්ද නොඑසේ නම් කෙසේ සාර්ථක කර ගත හැකිද යන්න තීරණය කළ හැකිය.

**(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)**

(iii) (අ) ඉහත සමාගම විසින් වෙළෙඳපොළ ඛණ්ඩනය සඳහා යොදාගෙන ඇති පදනම නම් කර, ඔබේ පිළිතුරට හේතුවක් දක්වන්න. (ලකුණු 02 යි)

- මනෝ විද්‍යාත්මක පදනම

**(ලකුණු 01)**

හේතුව - ඉහළ සමාජ තත්ත්වයක් ඇති පුද්ගලයින් ඉලක්ක කර ගැනීම

**(ලකුණු 01)**

(ආ) වෙළෙඳපොළ ඛණ්ඩනය මගින් සමාගමට ලබාගත හැකි ප්‍රතිලාභ හතරක් ලියන්න. (ලකුණු 02 යි)

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

1. සමස්ථ වෙළඳපොලම විශ්ලේෂණයට භාජනය කරන නිසා වෙළඳපොල පිළිබඳව අවබෝධයක් ලැබිය හැකිවීම
2. උචිත හා කාලීන වෙළඳපොල අවස්ථා හඳුනා ගත හැකිවීම
3. ආයතනය සතු සීමිත සම්පත් සඵලදායී හා කාර්යක්ෂම ලෙස යොදා ගැනීමට හැකිවීම
4. ආයතනයට වෙළඳපොල පිළිබඳ ඇති අවදානම අවම කර ගත හැකිවීම
5. අලෙවිකරණ වැඩසටහන් වඩාත් සාර්ථකව ක්‍රියාත්මක කළ හැකිවීම

**(1/2 x 4 = ලකුණු 02)**

(iv) (අ) මුහුණුපොත, යූ-ටියුබ්, ඉන්ස්ටග්‍රෑම් සහ ටික්ටොක් අයත්වන වෙළෙඳපොළ ප්‍රවර්ධන ක්‍රමය නම් කරන්න. (ලකුණු 02 යි)

සමාජ මාධ්‍යය ක්‍රමය

**(ලකුණු 02)**

(ආ) නිෂ්පාදන ජීවන චක්‍රයක වර්ධන අදියරේදී දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

1. විකුණුම් වර්ධනය වීම
2. ඉහළ ලාභාන්තිකයක් පැවතීම
3. තරගකාරීත්වය වර්ධනය වීම
4. බෙදාහැරීම පුළුල් වීම
5. පාරිභෝගික පදනම පුළුල් වීම
6. වෙළඳපල පුළුල්වීම (නව වෙළඳපල)
7. අලෙවිකරණ වියදම් වැඩිවීම

**(1 x 2 = ලකුණු 02)**

(v) (අ) මෙම සමාගමේ සමච්ඡේදන ලක්ෂ්‍යය ඒකකවලින් හා රුපියල්වලින් කොපමණ ද? (ලකුණු 02 යි)

$$BEP = \frac{65000000}{(10000000 - 3500000)}$$

$$= \frac{650\ 000\ 000}{650\ 00\ 000}$$

(පහත සංඛ්‍යාවල අවසාන බින්දු කපා හැර ඇත)

ඒකක $= 10$

(පිළිතුර පමණක් ප්‍රමාණවත්)

**(ලකුණු 01)**

$BEP$ රුපියල් $= 10 X 10\ 000\ 000$

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

$= රු. 100\ 000\ 000$

(පිළිතුර පමණක් ප්‍රමාණවත්)

**(ලකුණු 01)**

(ආ) සමාගම විසින් වාහන ඒකක 15 ක් අලෙවි කළේ නම්, ලාභය ගණනය කරන්න. (ලකුණු 02 යි)

$$විකිණිය\ යුතු\ ඒකක\ ගණන\ = 10\ X\ 10\ 000\ 000$$

$$විකිණිය\ යුතු\ ඒකක\ ගණන = \frac{ස්ථාවර\ පිරිවැය + ලාභය}{ඒකක\ දායකය}$$

$$15 = \frac{65000\ 000 + ලාභය}{6500\ 000}$$

$$ලාභය = රු. 32\ 500\ 000$$

(පිළිතුර පමණක් ප්‍රමාණවත්)

**(ලකුණු 02)**

7. (i) (අ) 'ද්‍රවශීලතා අනුපාතය' නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

කෙටි කාලීන මූල්‍ය බැඳීම් වලට (වගකීම්) මුහුණ දීමට ඇති හැකියාව පෙන්නුම් කරන අනුපාතයයි

**(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)**

(ආ) ව්‍යාපාරයක් සඳහා ද්‍රවශීලතා අනුපාතයෙහි ඇති ප්‍රතිලාභ **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

1. ව්‍යාපාරයක කෙටි කාලීන නුබුන්වත් බව හඳුනා ගත හැකිවීම
2. ව්‍යාපාරයේ ද්‍රවශීලතාවය හඳුනා ගැනීමට
3. මූල්‍ය ගැටලු හඳුනා ගැනීමට
4. වගකීම් හා වත්කම් කළමනාකරණයට උපකාරවීම
5. ව්‍යාපාරයේ මූල්‍ය ශක්තිය නිර්ණය කිරීමට

**(1 x 2 = ලකුණු 02)**

(ii) (අ) ව්‍යාපාරයක් සඳහා මූල්‍ය අයවැයක් සැකසීමෙන් ලැබෙන ප්‍රතිලාභ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

1. යහපත් මූල්‍ය තීරණ ගැනීමට
2. මුදල් ප්‍රවාහ කළමනාකරණයට (මුදල් අතිරික්තය හා මුදල් ඌනතාවය හඳුනා ගැනීමට)
3. වියදම් කළමනාකරණයට
4. ව්‍යාපාරික ණය ලබා ගැනීමට
5. ආදායම් කළමනාකරණයට
6. මූල්‍ය පාලනයට (සත්‍ය මුදල් ක්‍රියාකාරිත්වය හා මුදල් පිළිබඳව සැළසුම්කරණය හා පාලනය පහසුවීමට)
7. කාර්යක්ෂමතාව වර්ධනයට

**(1/2 x 4 = ලකුණු 02)**

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ 'අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ' යනු කුමක් ද? (ලකුණු 02 යි)

ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති බැංකු සංචිත ගිණුම් හරහා වාණිජ බැංකු අතර කෙටි කාලීන ණය ඉල්ලුම් හා ණය සැපයුම් සිදුවන වෙළඳපොලයි.

**(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)**

(iii) (අ) සමාගමක් සඳහා සේවක අතිරික්තය බලපාන ආකාරය විස්තර කරන්න. (ලකුණු 02 යි)

1. පිරිවැය වැඩිවීම
2. සේවක නිෂ්ක්‍රිය කාලය වැඩිවීම
3. සේවකයින් අධෛර්යමත්වීම සිදුවීම
4. සමස්ත නිෂ්පාදනය අඩුවීම
5. මූල්‍ය ගැටළු ඇතිවීම
6. සේවක පිරිවැටුම/ සේවක ප්‍රවාසිතාවය වැඩිවීම

**(ඉහත කරුණු වලින් 2ක් ඇතුලත්ව සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)**

(ආ) සමාගමක සේවක දුක්ගැනිවිලි හඳුනාගැනීමට භාවිත කළ හැකි ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

1. ඉවත්ව යාමේ සම්මුඛ සාකච්ඡා
2. යෝජනා පෙට්ටි
3. සේවක ආකල්ප සමීක්ෂණය
4. විවෘත දොරටු ප්‍රතිපත්ති

**(1 x 2 = ලකුණු 02)**

(iv) (අ) සේවකයින්ට විරුද්ධව සේව්‍යයාට ගත හැකි විනය ක්‍රියාමාර්ග හතරක් දක්වන්න. (ලකුණු 02 යි)

1. වාචිකව අවවාද කිරීම
2. ලිඛිතව අවවාද කිරීම
3. දඩ ගැසීම හෝ අලාභය අය කර ගැනීම
4. වේතන රහිතව තාවකාලිකව වැඩ නතර කිරීම
5. විනයානුකූලව සේවා ස්ථානය මාරු කිරීම
6. වැටුප් වර්ධක නතර කිරීම හෝ ප්‍රමාද කිරීම
7. සේවයෙන් ඉවත් කිරීම

**(1/2 x 4 = ලකුණු 02)**

(ආ) සාමාජිකයකුට සේවක භාරකාර අරමුදලින් (ETF) ලබාගැනීමට හිමිකම් ඇති ප්‍රතිලාභ හතරක් ලියන්න. (ලකුණු 02 යි)

1. මරණයකදී ප්‍රතිලාභ ලැබීම
2. ණය ලබාගත හැකිවීම
3. 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත් දරුවන්ට ශිෂ්‍යත්වය ලබා දීම
4. වෛද්‍යාධාර ලබාදීම (අක්ෂි කාච හා හදවත් සැත්කම් සඳහා)
5. නිත්‍ය දුබලතා සඳහා රක්ෂණාවරණයක් ලැබීම
6. උසස් පෙළ ළමයින්ට වෘත්තීය පාඨමාලා සඳහා අරමුදල් සැපයීම

**(1/2 x 4 = ලකුණු 02)**

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(v) (අ) 'කාර්යඵල ඇගයීම' යනු කුමක් ද? (ලකුණු 02 යි)

සේවා දායකයා විසින් සේවකයාගේ රැකියාව කොතෙක් දුරට ඉටු කරන්නේදැයි සොයා බලා වාර්තා කිරීමම් ක්‍රියාවලියයි.

**(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)**

(ආ) 'කුසලතා ඉන්වෙන්ට්‍රියක්' (Skill inventory) පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරයකට අත්වන වාසි දෙකක් විස්තර කරන්න. (ලකුණු 02 යි)

1. කුසලතා පරතරය හඳුනා ගැනීමට
2. පුහුණුව හා සංවර්ධන අවස්ථා හඳුනා ගත හැකිවීම
3. වර්තමාන සේවකයාගේ කුසලතා හඳුනා ගත හැකිවීම හා ඇගයීම
4. කුසලතා සහිත සේවක පිරිස අඛණ්ඩව පවත්වා ගත හැකිවීම
5. අනුප්‍රාප්තිකයින් හඳුනා ගැනීමට හැකිවීම
6. සේවක උසස්වීම් ලබා දීමට

**(1 x 2 = ලකුණු 02)**

**8.** (i) (අ) දත්ත ඉදිරිපත් කළ හැකි ක්‍රම හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

1. රූපමය දත්ත
2. සංඛ්‍යාමය දත්ත
3. ශ්‍රව්‍යමය දත්ත
4. දෘශ්‍යමය දත්ත

**(1/2 x 4 = ලකුණු 02)**

(ආ) හොඳ තොරතුරක ඇතුළත් ගුණාංග හතරක් නම් කරන්න. (ලකුණු 02 යි)

1. විස්තරාත්මක බව
2. නම්‍යශීලී බව
3. ලබාගැනීමේ පහසුව
4. සංසන්දනය කළ හැකි බව
5. අවබෝධ කර ගත හැකි බව
6. විශ්වාසදායක බව
7. නිවැරදි බව
8. කාලීන බව
9. පිරිමැසුම් බව
10. පූර්ණ බව
11. අදාළ බව

**(1/2 x 4 = ලකුණු 02)**

(ii) (අ) තොරතුරු තාක්ෂණය භාවිත කිරීමෙන් සංවිධානයකට ලබාගත හැකි ප්‍රතිලාභ දෙකක් විස්තර කරන්න. (ලකුණු 02 යි)

1. ඉතා සංකීර්ණ දැ වුවද ඉතාම වේගයෙන් ලබා ගෙන වර්ග කර නැවත භාවිතය සඳහා යොදා ගත හැකිවීම
2. විද්‍යුත් තොරතුරු මෙහෙයුම් ක්‍රියාවලියට මිනිසුන් අඩු වශයෙන් සහභාගී වීම නිසා සිදුවන වැරදි අවමවීම
3. ඉතා සියුම් ලෙස නොයෙකුත් කාර්යයන් සඳහා යොදා ගැනීමටත් එම කාර්යයන් අනුව වෙනස් කිරීමටත් හැකිවීම
4. විශාල තොරතුරු ප්‍රමාණයක් කළමනාකරණය කළ හැකිවීම
5. තොරතුරු උසස් ගුණත්වයෙන් යුතු වීම
6. වැඩි තොරතුරු ප්‍රමාණයක් කළමනාකරණය කළ හැකිවීම

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

7. අඩු සේවක සංඛ්‍යාවක් ප්‍රමාණවත් වීම
8. අඩු ඉඩකඩ ප්‍රමාණයක් ප්‍රමාණවත් වීම
9. පිරිමැසුම් දායක වීම නිසා පිරිවැය අවම කරගත හැකිවීම **(1 x 2 = ලකුණු 02)**

(ආ) 'ගොනු හුවමාරු ක්‍රියාවලිය' (File Transfer Protocol) යන්න පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

පරිගණක ජාලයක් හරහා පරිශීලයෙකුගේ පරිගණකයෙන් සේවා දායක පරිගණකයට හෝ ඊට ප්‍රතිවිරුද්ධව ලිපි ගොනු හුවමාරු කිරීමට භාවිත කරන ක්‍රමයකි.

**(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)**

(ගුරු අත්පොතේ නිර්වචනයට ද ලකුණු දෙන්න)

(iii) (අ) හිමිකාරීත්ව මෘදුකාංග (Proprietary software) හා විවෘත මූලාශ්‍ර මෘදුකාංග (Open-source software) අතර ඇති ප්‍රධාන වෙනස දක්වන්න. (ලකුණු 02 යි)

හිමිකාරත්ව මෘදුකාංග යනු කිසියම් ව්‍යාපාරයක හෝ පුද්ගලයෙකු නිර්මාණය කර එයට ගෙවීම් කිරීමෙන් භාවිත කිරීමට හැකිවීම සිදුවන අතර භාවිත කරන්නාට වෙනස් කිරීම් සිදු කළ නොහැක.

විවෘත මූලාශ්‍ර මුලිකාංග යනු භාවිත කරන්නාට ගෙවීමකින් තොරව ලබා ගත හැකි අතර එය වෙනස්කිරීමට හෝ වැඩි දියුණු කිරීමට හැකිය.

**(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)**

(ආ) 'පරිගණක වෛරසයක්' යනු කුමක් ද? (ලකුණු 02 යි)

භාවිත කරන්නාගේ අනුදැනුම හෝ අවසරයකින් තොරවඩි සටහන් හසුරුවනු ලබන පරිගණක වැඩසටහනකි. එම වෛරසය විසින්ම නැවත නැවත උත්පාදනය වෙමින් පැතිරී යාමට කටයුතු කරයි.

**(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)**

(iv) (අ) අලෙවි සැලසුමේ තරඟකාරී විශ්ලේෂණය තුළ ඉදිරිපත් කළ යුතු තොරතුරු හතරක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

1. පවත්නා තරගකාරිත්වය
2. තරගකරුවන් හා ඔවුන්ගේ ශක්තීන්
3. තරගකාරිත්වයට මුහුණදීමට තමා සතු ශක්තීන් හා දුර්වලතා
4. වෙළඳපලට පිවිසීමට ඇති බාධා **(1/4 x 2 = ලකුණු 02)**

(ආ) සංවිධානයකට ව්‍යාපාර සැලසුමක් අවශ්‍ය වන්නේ ඇයි, දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

1. ව්‍යාපාරය අනාගතයේදී යා යුත්තේ කොතනටදැයි පෙන්නුම් කිරීමට (දැක්ම, නිෂ්ටාව, පරමාර්ථ, අරමුණු පැහැදිලි කිරීම)
2. ව්‍යාපාරය පිළිබඳව ඇල්ම ඇති පාර්ශ්වයන්ට අවබෝධයක් ලබාදීමට
3. ව්‍යාපාරයට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාදීමට
4. ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් හඳුනාගැනීම හා සම්පත් නිසි පරිදි හැසිරවීමට
5. සියලු දෑ උචිත පරිදි දැක්වීම නිසා අනාගත ව්‍යාපාරික කටයුතු මනා ලෙස සංවිධානය කර ගැනීමට හැකිවීම
6. ව්‍යාපාරයේ කාර්ය සාධනය ඇගයීම සඳහා ප්‍රයෝජනයට ගත හැකිවීම
7. ව්‍යාපාරයේ තනතුරු සඳහා සේවකයින් ආකර්ෂණය කර ගැනීමට උපකාරිවීම
8. නියාමනය හා පාලනයට අවශ්‍යවීම

**(ඉහත කරුණු 2ක් ඇතුළත්ව සම්පූර්ණ පිළිතුරට ලකුණු 02)**

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(v) (අ) 'කාරක ප්‍රාග්ධනය' යනු කුමක් ද? එය ව්‍යාපාරයකට අත්‍යවශ්‍ය ඇයි දැයි හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය අරමුදල් ප්‍රමාණයයි.

**(ලකුණු 01)**

හේතු

1. එදිනෙදා ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට
2. ස්ථාවර වත්කම් ප්‍රයෝජනයට ගැනීමට
3. සැළසුම් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට
4. ව්‍යාපාරයේ මූල්‍ය කීර්ති නාමය ආරක්ෂා කිරීමට
5. අවදානම අවම කර ගැනීමට

**(1/2 x 2 = ලකුණු 01)**

(ආ) ශ්‍රී ලංකාවේ මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර සංරක්ෂණ බලපත්‍රයක් (EPL) ලබා ගැනීමෙන් ව්‍යාපාරයකට අත්වන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

1. බාහිර පරිසරයට අපද්‍රව්‍ය විමෝචනය මගින් සිදුවන පාරිසරික දූෂණ වැළැක්වීම සඳහා නීතිමය ආරක්ෂණය ලැබීම
2. කර්මාන්ත විසින් මුදා හරින ද්‍රව්‍ය මගින් පරිසරයට සිදු වන බලපෑම් අවම කිරීම
3. පරිසර දූෂණය පාලනය සඳහා
4. තාක්ෂණික උපදෙස් ලැබීමට හැකිවීම
5. ජාත්‍යන්තර වෙළඳපල තරගයට සාර්ථකව මුහුණදීමට හැකිවීම

**(1 x 2 = ලකුණු 02)**

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/